## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා කාර්යය මණ්ඩලය බඳවා ගැනීම

### 01. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 3 වන කොටස යුරෝපීය ආයෝජන බැංකු (EIB) අරමුදල් මගින් මූල්‍යනය කර ඇත. මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ කොළඹ මහා නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ වඩා හොඳ අපජල කළමනාකරණ සේවාවන් සැපයීම මගින් මහා කොළඹ පදිංචිකරුවන්ගේ නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍යය වැඩි දියුණු කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැය ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 53කි. ව්‍යාපෘතියේ කාලසීමාව මාස 30කි. 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) පහත සඳහන් පුරප්පාඩුව සඳහා සුදුසුකම් සපුරන හා යෝග්‍ය නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් මට්ටම |
|---|---|---|
| ඉදිකිරීම් කළමනාකරු | 01 | PS 3 |

**සාමාන්‍ය කොන්දේසි**

- ශ්‍රී ලාංකික පුරවැසියන් පමණක් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.
- විදේශ ව්‍යාපෘතිවල අත්දැකීම් සහිත අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලබයි.
- **තෝරාගැනීමේ ක්‍රමය** - සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කළ අයදුම්පත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.
- **වයස** - අයදුම්පත් භාර ගන්නා අවසාන වන දිනට වයස අවු. 64ට අඩු විය යුතුය.
- **රැකියා කොන්දේසි** - මෙම පත්වීම පූර්ණකාලීන පදනමින් වන අතර කොන්ත්‍රාත් සේවා කාලය බඳවා ගැනීමේ දින සිට 2024.12.31 දින දක්වා වන අතර, කාර්යසාධන මට්ටම අනුව ව්‍යාපෘතියේ ඉතිරි කාලය සඳහා දීර්ඝ කිරීම සලකා බැලේ.
- රාජ්‍ය / අර්ධ රාජ්‍ය අංශයේ සේවය කරනු ලබන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු වේ.
- මේ සම්බන්ධයෙන් කැමැත්තක් දක්වන අයදුම්කරුවන් තම ජීව දත්ත ප්‍රකාශය (CV) අදාළ අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද සහතික කරන ලිපිලේඛනවල සහතික කළ පිටපත් සමග **ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාතයාංශය, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2024 මැයි 31 වන දින පස්වරු 3.00ට පෙර එවිය යුතු වන අතර, එහි මෘදු පිටපත් admin.div@pclg.gov.lk යන විද්‍යුත් ලිපිනයට ඉහත දිනයේදී එම වේලාවට හෝ ඊට පෙර යොමු කළ යුතුය.
- තනතුරු නාමය සහ ව්‍යාපෘතියේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු වේ.
- අසම්පූර්ණ අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහතිකපත්වල තොරතුරු හා නොගැළපෙන අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු.:** තනතුරට අදාළ සුදුසුකම්, පළපුරුද්ද හා වැටුප් සම්බන්ධ තොරතුරු සහ වෙනත් අමතර තොරතුරු සඳහා කරුණාකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019.03.05 දිනැති චක්‍රලේඛය පරිශීලනය කළ යුතුවේ.

**ලේකම්,**
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,**
**පළාත් සභා සහ පළාත් පාලන අමාතයාංශය.**

2024.05.07